
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND
*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
***Editor*** : **Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam



## අති උත්තම ජයග්‍රහණය

**අ**ප ආදරණීය පාඨක හිතවතුනි!

වසර ගණනාවක් පුරා මේ වචන ටික ලියන්නට සිදුවේවායි අප උදක්ම බලාගෙන සිටි, බලාපොරොත්තුව සිටි, ජීවමානව ම අප ජීවිත කාලය තුළ දකින්නට පෙරුම්පිරූ, දිවා රාත්‍රී අනන්ත වූ සිහින මවමින් සිටි ඒ අතිශය රමණීය දිනය උදා විය. වචනයෙන් විස්තර කළ නොහෙන අත්‍යන්ත ප්‍රීතියේ උල්පතක් වන ඒ මහාර්ඝ ජයග්‍රහණය අපේ දේශයට, ජන සමූහයාට අත්වූයේ කෲර වූ ත්‍රස්තවාදය අප වීර පුත්‍රයින්ගේ අප්‍රතිහත ධෛර්යය තුළින් ශ්‍රීලංකා භූමිතලයෙන් සදහටම අතුගා දමමිනි.

2009 මැයි මස 18 වන දින දෙමළ ඊළම් කොටි ත්‍රස්තවාදී කණ්ඩායම මුලුමනින්ම විනාශ කර දැමූ රැයේ ලංකා මාතාව වසර 30ක කාලය කට පසු සිත සැනසිල්ලේ නිදි සුව ලැබුවා ය.

ත්‍රිවිධ හමුදාපතිවරු ජනාධිපතිතුමා වෙත ගොස් තමන්ට පැවරූ කාර්යය නිම කළ බව උදාර සිතින් දැන්වූහ. අප්‍රමාදී ව එදින ම ඒ හමුදා නායකවරු සැබැවින්ම ලබන්නට වටිනා උසස්වීම් වලින් ජනපති අතින් පිදුම් ලැබූහ.

යුද්ධය නිමාවූ ප්‍රීතිය ගැන තවමත් සිතමින්, ප්‍රීතිවෙමින්, දෛනිකව කතා බහ කරමින්, ඒ පිළිබඳව පුවත්පත් කියවමින් හා රූපවාහිනී මාධ්‍යයන්හි දකිමින් පසුවන අප සැම ඒ පිටු-පස ඇති සංවේගදායක හා බැරෑරුම් චිත්‍රය ද දැකිය යුතු ය. එම ජයග්‍රහණය ලියැවී, කෙටී, ඔපමට්ටම් වී ඇත්තේ අප මව්බිමේ ජනිත වූ උදාර පුත්‍රයින්ගේ දහඩිය, කඳුළු, වේදනාව හා ජීවිත පරිත්‍යාගයෙන් බව වටහාගත යුතු ය. විශාරද අමරදේවයන් ගායනා කරන, මහගම ලියූ *“ ඒ අභීත දූ පුතුන්.... ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ... ජීවිතේ පුදා හෙලූ ලේ කඳයි.”* යන ගී පද මෙහිදී සිහිපත් කරනු වටී. සත්‍යය එය මිස අන් කිසිවක් නොවේ. එදා ද, අද ද සිය පණ පුදා අප ලක්මව ආරක්ෂා කළේත්, නිසැකවම හෙට ද ආරක්ෂා කරනු ඇත්තේත් ඒ අභීත දූ පුතුන් ම ය.

කුරිරු ත්‍රස්තවාදීන් අතින් ඝාතනයවූ දූ දරුවන් සොයුරු සොයුරියන් හා පූජක පක්ෂය වෙනුවෙන් ලක්ෂ සංඛ්‍යාත වාරයක් අප දේශයේ ජනතාව අතිශය දුකට වේදනාවට පත්ව හෙලූ කඳුළු වල නිමක් නැත. එහෙත් ඒ අතරේ එම ත්‍රස්තවාදය දැක දැකත් ත්‍රස්තවාදීන්ට උදව් කළ රටවල් කොතෙක් ද? අප රටෙහි ඇතුළේ ම කොතෙක් සිටියේද? මේ ජයග්‍රහණය ඉතා දුෂ් කර වූයේ ඒ නිසා ය. එලෙසම නිවැරදි නාය-කත්වයක්ද නොවූ බැවිනි. එකී සියල්ල අභිබවා ජයටැඹ වෙත ළඟාවීමට අප දැයට හැකිවූයේ ඒ සියල්ල කළේ උතුම් පරමාර්ථයක් වෙනුවෙන් නිසාය. ත්‍රස්තවාදියා සුන්නද්දූලි වී ගියේ ද එහි අනෙක් පැත්ත වූ දුෂ්ට අසාධාරණ චේතනාවක් ඔහුට තිබුණු බැවිනි.

ආදරණීය ලක් මෑණියනි, දැන් සියල්ල ජයග්‍රාහීව අවසන් ය. ඔබට සිනා මුවින් යුතුව සැනසිල්ලේ වෙසෙන්නට සාමකාමී ආරක්ෂිත වාතාවරණයක් ඔබේ නිබය රණශූර දූ පුතුන් විසින් සකස් කරනු ලැබ ඇත. එවැනි දරුවන් ලද ජාතියක් සැබැවින්ම වාසනාවන්ත ය. යළිත් කිසිදාක කිසිවෙකුටත් ඔබ ඇසට කඳුලක් නංවන්නට ඔවුන් ඉඩ තබන්නේ නැත.

## බුද්ධිමත් නායකයා රටකට ආභරණයකි!

### හිතෝපදේශයෙන්

**තස්කරෙභ්‍යො නියුක්තෙභ්‍ය:**
**ශත්‍රෘභ්‍යො නෘප වල්ලභාත්**
**නෘපතිර් නිජලොභාත් ච**
**ප්‍රජා රක්ෂෙත් පිතෙව හි**

***අර්ථය*** : රජතෙම තම රටේ ප්‍රජාව සොරුන්ගෙන් ද, තම නිලධාරීන්ගෙන් ද, සතුරන්ගෙන් ද, තමාගේ ලෝභයෙන් ද පියෙකුසේ ආරක්ෂා කරන්නේ ය.

**පා**ලනය ඉතා අසීරු කටයුත්තකි. එයින්ද ප්‍රජා පාලනය වඩාත් අසීරුය. රාජ්‍ය පාලනය ඊටත් වඩා මහා බැරෑරුම් කාර්යයක් වන්නේය. පාලකයෙකු තම යුතුකම්වගකීමෙන් යුතුව නිසි ලෙස කරගෙන යාමට නම් ඔහුට උතුම් ගුණධර්ම කීපයක් තිබිය යුතුය. බුද්ධිමත්බව, කාර්යශීලීබව, එඩිතරබව, ස්ථානොචිත ප්‍රඥාව, කෝප නොවීම, ත්‍යාගශීලීභාවය සහ කැපවීම එම ගුණධර්ම වලින් කොට-සකි. එවැනි දෙයින් තොර වූවහු දුර්වල පාලකයෙක් වෙති. දුර්වල පාලකයාට සතුරෝ බොහෝය. කරදරද බහුලය. එමෙන්ම එම රට සෞභාග්‍යයෙන් තොරය.

අධික කම් සැපතෙහි ඇලීම රාජ්‍ය පාලකයෙකු සතු නොවිය යුත්තකි. නමුත් ඇතැම් පාලකයින්ගේ එකම අභිලාෂයද එයයි. කම් සැපෙහි ඇළුණු රජවරු තම රාජකාරිය සුළුවෙන් තකති. අනුන්ගේ සදුපදේශයන් ද ලඝුකොට සිතති. සිය කැමැත්ත අනුව හැසිරෙන, අහංකාරයෙන් මැඩුණු එවන් අය සාහිත්‍යයේ මත් ඇතෙකුට උපමාකර ඇත. තම නොහික්මුණු බව නොදත් ඔහු අනුන් කෙරෙහි දොස් පවරයි.

ඇතැම් නායකෝ නිතරම අනුන්ගේ බසට පමණක් කන්දී කළයුතු නොකළ යුතු දැ තේරුම් නොගෙන කටයුතු කිරීමට පෙළඹෙති. විපතක් ඇතිවූ කල්හි ඉන් මිදීමට නොහැකිව ඒ විපතටම ගොදුරු වෙති. එවැන්නන් අන්ධයින්ට උපමා කොට ඇත.

සංස්කෘත සාහිත්‍යයට අයත් ප්‍රත්‍ය ශතකයේ රජෙකු පිළිබඳ හොඳ උපමාවක් දක්වා තිබේ. සුමිහිරි සුවඳ වහනයවන, එහෙත් කටුවලින් ගැවසීගත් කේතකී පුෂ්පය කිසිවෙකුට නෙලාගත නොහැකිව නිෂ්ප්‍රයෝජන වන්නා සේම දුෂ්ට ඇමතිවරුන් විසින් පිවරන ලද රජෙකු ලෝකයාට නිෂ්ප්‍රයෝජන වන්නේය. නොයෙක් ආකාරයේ වංචනික දූෂිත මැති ඇමතිවරුන් විසින් පිරිවරන ලද බොහෝ නායකයන්ගේ අද ඉරණම ද එයයි.

යහපත් නායකයෙකුගේ තවත් ගුණයක් වන්නේ තම රාජ්‍යයේ භූමියේ විනාශය හා පුරවැසියන්ගේ විනාශය තමන්ගේ විනාශයක් ලෙස සැලකීමයි. එම නිසා තම රටේ භූමිය ආරක්ෂාකර ගැනීමටත්, පුර-වැසියන් ආරක්ෂාකරගැනීමටත්, ඕනෑම සතුරෙකුට එරෙහිව කටයුතු කිරීමටත් ඔහු අප්‍රමාදීව ඉදිරිපත්වෙයි. එසේ අණ කඩකරන්නන්හට දඬුවම් පැමිණවීමේදී සාමාන්‍ය ජනතාව හා තම දූ පුතුන්ද සම ලෙස සලකනු ලබයි.

ඉහත පද්‍යයෙන් කියවෙන්නේද ශ්‍රේෂ්ඨ රජෙකු සතු උදාර ගුණයන් පිළිබඳවයි. එනම් තම රටේ ප්‍රජාව කෙරෙහි රක්ෂාවරණය සලස්වන ආකාරයයි. ඔහු සතු ප්‍රධාන කාර්යයද විය යුත්තේ ද එයයි. රාජ්‍යය ආරක්ෂාකරන අතරම ප්‍රජාවගේ ආරක්ෂාවත් සැලසීමයි. රාජ්‍යයක නොයෙක් ආකාරයේ සොරුන් වංචනිකයින් ගහණවීම අරුමයක් නොවේ. එය එක රාජ්‍යයකට පමණක් උරුම වූවක්ද නොවේ. ඇතැම් රාජ්‍යවල නායකයාගේ පටන් මැති ඇමතිවරු, රාජ්‍ය නිලධාරීන් ඇතුළු බොහෝ සොරුන්ගෙන් යුක්තය. එම සොරුන් ගෙන් මංකොල්ල කරුවන්ගෙන් ප්‍රජාව ආරක්ෂා කරගත යුතුය.

අනෙක් අතට රාජ්‍ය නිලධාරීන්ගෙන් පුරවැසියන් ආරක්ෂාකර ගැන්මටද සිදුවේ. මෙම අදහස එදාටත් වඩා අදට උචිතය. රාජ්‍ය නිලධාරීන්ගේ කොමිස්, දූෂණ, වංචා ආදී නොයෙක් අකටයුතුකම් වලින් ඔවුන් මුදවා ගැන්මට සිදුව ඇත. සතුරු බලවේගයන්ගෙන් ජනතාව මුදවා ගැනීම ඊළඟ කරුණයි. මෙම අභ්‍යන්තර හා බාහිර සතුරු බලවේග වලින් විය හැකියි. රට තුළ ක්‍රියාත්මක වන ත්‍රස්තවාදී, බෙදුම්වාදී උවදුරු හෝ විදේශ කුමන්ත්‍රණ කරුවන්ගෙන් හෝ විය හැකියි. එනිසා ඔවුන්ගේ ග්‍රහණයෙන්ද තම ප්‍රජාව මුදවාගැන්ම රජෙකු සතු අවදානම් සහ භාරදූර කාර්යයකි.

ඇතැම් විට තම මිතුරන්ගෙන්ද මහජනතාවට යම් යම් අනතුරු විපත් සිදුවිය හැකිය. රජුගේ බලය ආරූඪකරගත් යම් යම් කුහකයින් අයථා ලෙස ප්‍රජාවගෙන් ප්‍රයෝජන ගතහැකියි. එනිසා එවැනි මිත්‍ර ප්‍රතිරූපකයන්ගෙන්ද ජනතාව මුදාගත යුතු අතර අවසාන වශයෙන් තම ලෝභයෙන්ද ඔවුන් ආරක්ෂා කරගත යුතුය. සම්පත්හි ගිජු රජෙකු ප්‍රජාවගේ සුබසාධනය සහ රටේ සංවර්ධනය නොසලකා සියළු සම්පත් තමා වෙතම රැස්කර තබාගැන්මට කටයුතු කරයි. එහෙයින් රාජ්‍ය නායකයා එවැනි පහත් තත්වයකට පත් නොවීමටද ප්‍රවේශම් විය යුතුය.

මෙම පද්‍යයේ සඳහන් වන ආකාරයට නියම රජෙකු තම රටවැසියාට ආදරණීය පියතුමෙකි. පියෙකු තම දරුවන් දරු සෙනෙහසින් යම්සේ රකින්නේද, පෝෂණය කරන්නේද එසේම නියම රජෙකු නම් තම රටේ ජනතාව කෙරෙහි දරු සෙනෙහසින් යුතුව සියළු උවදුරුවලින් ඔවුන් වළකා ඔවුන් සුඛිත මුදිත කොට රාජ්‍යද දැහැමෙන් පවත්වාගෙන යයි. අවසාන වශයෙන් කිවයුත්තක් ඇත. යමෙකුට බුද්ධිය වේනම් ඔහුට බලය හිමිවිය යුතුය. නුවණ නැත්තාට බලය භයානකය. එවැන්නෙකුට බලය ලැබුණොත් ඔහුගේත් අන්‍යයන්ගේත් විනාශය පිණිසම එය පවතී. ඒ අනුව බුද්ධිමත් නායකයා රටකට සෞභාග්‍යය ගෙන එයි. ඔහු ඒ රටට සම්පතකි. ආභරණයකි.



**♦ *පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue - London W4 1UD**

## සියල්ල මෙසේ සිදුවිය



**ලෝ**ව භයානකම ත්‍රස්ත වාදය මුලිනුපුටා දැමූ රාජ්‍ය නායකයා මෙන්ම සේනාධිනායකයා ලෙස ජනතා ගෞරවයට පාත්‍රවූ ජනාධිපති මහින්ද රාජ පක්ෂ මහතා මැයි මස 17 වෙනි දින අළුයම ජෝර්දා නයේ සිට ලංකාවට පැමි ණියේ ය. ජෝර්දානයේ ජී 11 සමුළුව ඇමතූ ජනාධි පතිවරයා එය අවසන් කළේ “ මා ආපසු යන්නේ ත්‍රස්තවාදයෙන් විනිර්මුක්ත රටකටය ” යන උදාන වාක්‍යයෙනි. ඒ වනවිට සැබැවින්ම උතුරේ සියළු කොටිබලය අප වීරෝදාර හමුදා විසින් සහමුලින්ම වනසන ලද බව එතුමා දැන සිටින්නට ඇත.



කටුනායක ගුවන් තොටුපළට ළඟාවූ එතුමෝ එහි පොළවට පා තැබූ සැනින් සිය මව්බිමට දණ නමා නමස්කාර කළහ. එය අතිශය හැඟුම්බර මොහොතක් විය.

ජනතාව තුළ නැවුම් බලා පොරොත්තු දැල්වූ මේ ජනනායක යාගේ පැමිණීම රූපවාහිනී නාලිකා මගින් සජීවීව නැරඹූ ශ්‍රීලාංකික ජන තාව ඒ සමගම රතිඤ්ඤා දල්වමින් ජාතික ධජය අතින්ගෙන ජය ඝෝෂා කරන්නට වූහ. නගර ගම් සිසාරා මේ රතිඤ්ඤා හඬ පැතිර ගියේ ය.

ජනාධිපතිවරයා පිළිගැන්මට සියළු ආගම් නියෝජනය කරන පූජ්‍ය පක්ෂයද රජයේ මැති ඇමතිවරු ඇතුළු විශාල පිරිසක් එදින ගුවන් තොටු පළට පැමිණ සිටියහ. ඒ සියල්ලෝ එතුමන්ට සුබපැතූහ. ආශීර්වාද කළහ. කුරිරු ත්‍රස්තවාදයෙන් දේශය මුදාගන්නට නායකත්වය දීම ගැන මුව නොසෑහෙනසේ ප්‍රශංසා කළහ.

ප්‍රභාකරන් නමැති ම්ලේච්ඡ ත්‍රස්තවාදියා ද, ඔහුගේ ත්‍රස්ත පුත්‍රයාද ඇතුළු සියළු කොටි ත්‍රස්ත නායකයන් හමුදා වෙඩි ප්‍රහාරයන් ගෙන් මිය ගිය බැව් ලැව්ගින්නක් මෙන් ශ්‍රීලංකාව හා ලෝකය පුරා පැතිර යත්ම අප රටේ මෙන්ම ලොව පුරාවෙසෙන දහස් සංඛ්‍යාත ශ්‍රී ලාංකික දේශප්‍රේමී ජනතාවගේ සිතසතන් හි හා මුවින් නැගුණ ප්‍රීතියේ ගිගුම් හඬ ඉහළ වා තලය සිසාරා යන්නට ඇත.

දින දෙකකට පසු එනම් මැයි මස 19 වෙනි දින ජනාධිපතිතුමා ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ නව සැසි වාරය අරඹමින් දීර්ඝ වූද සාරවත් වූද දේශනයක් කළේය. ත්‍රස්තවාදය අප මාතෘ භූමියෙන් අතුගා දමන් නට දිවිපුදා සටන්කළ අභීත රණ විරුවන්ටත් ඊට නායකත්වය දුන් හමුදා ප්‍රධානීන්ටත් එතුමා ප්‍රශංසා කළේය. ඒ කතාවේ කියැවුණු මූලික ම දේ මේ ප්‍රකාශ දෙකෙහි අඩංගුය.

“ ශ්‍රීලංකාවේ සෑම බිම් අඟලක් තුළම මෙතැන් සිට ක්‍රියාත්මක වෙන්නේ මේ උත්තරීතර පාර්ලිමේන්තුව සම්මත කරන නීති රීති පමණයි.”

“ පළමුව මට වටින්නේ මගේ මව් බිම. දෙවනුවත් මගේ මව්බිම. තෙවනුවත් මගේ මව්බිම. ඔබටත් එසේ විය යුතුයි. ” එතුමෝ කීහ

මාතෘ භූමියට ඉමහත් ගෞරවයක් දක්වන ශ්‍රේෂ්ඨ නායකයෙකු රටට පහළවීම මාතෘභූමියට ආදරය කරන සියළු ශ්‍රීලාංකික ජනතාවගේ වාසනාවකි.

**♦ *වෙනුර***

**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772**

**Colombo Office**
**Visa Refusals**
**Property Purchase in Sri Lanka**

**Hegoda & Hegoda**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**